2020 සැප්තැම්බර් මස 08 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝහිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ර්.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරීම

**01.01** 2020.08.11 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.08.11වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

2020.08.11 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එම වාර්තා මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩි සංශෝධනයක් තිබෙනවා. 40 වෙනි පිටුවේ පින්නදූව දහම් පාසලට ගොඩනැගිල්ලක් ලෙස සංශෝධනය විය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සංශෝධනය කරන්න.

**තීරණය**

2020.07.07 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන **නැත**

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 2020 ජුලි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

**තීරණය -**

2020 ජුලි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.02 අම්බලන්ගොඩ, පොල්වත්ත රජයේ ආයුර්වේද රෝහලට කසළ බඳුන් 05 ක් ලබාදෙන ලෙස ඉල්ලා කාර්යභාර වෛද්‍ය නිලධාරී විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ, පොල්වත්ත රජයේ ආයුර්වේද රෝහලට කසළ බඳුන් 05 ක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.03 අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල පැවැත්වීම සඳහා නොමිලේ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2020 අගෝස්තු මස 28,29 හා 31 යන දිනයන්හි පැවැත්වීමට නියමිත අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනයේ නොමිලේ පැවැත්වීම සඳහා සභා අනුමැතියට යටත්ව ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.04 නගර සභා ශරීර සුවතා මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ ලබාදෙන ලෙස ඉල්ලා යූ.ඒ.ටී.එන්.ජයවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

නගර සභා ශරීර සුවතා මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

01. ව්‍යායාම කිරීමට බිමට අතුරන අඩි 02 ක් පළප අඩි 05 ක් දිග රබර් කාපට් 06 යි.
02. යකඩ පටි (10 Kg x 4/5 Kg x 6/2.5 Kg x 8/1.25 Kg x 8/500g x 8)
03. යකඩ බාර් (අඩි6 x2/අඩි 05x2/ z බාර් 01)
04. Fix dumbbell(10 Kg x 2/75 Kg x 2/5 Kg x 2/2 Kg x 4/1 Kg x 6)
05. Incline bench – 01
06. Machine cable (අමතර 04)
07. Triceps push down ව්‍යායාමය සඳහා භාවිත කරන අඩි 02 rope එක
08. Emergency Lamp - 01

**03.05 2020 වර්ෂය සඳහා ජාතික කියවීමේ මාසය වැඩසටහන පැවැත්වීම සම්බන්ධව ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

2020 වර්ෂය සඳහා ජාතික කියවීමේ මාසය වැඩසටහන පැවැත්වීම සඳහා පාසැල් සිසුන් සහභාගී කරගැනීමට නොහැකිවීමේ ගැටළුව පිළිබඳව ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.06 පරිශ්‍රය ඉදිරිපස පිවිසුම් මාර්ගය නිරවුල් කරගැනීම යන මැයෙන් අම්බලන්ගොඩ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය මගින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

පරිශ්‍රය ඉදිරිපස පිවිසුම් මාර්ගය නිරවුල් කරගැනීම යන මැයෙන් අම්බලන්ගොඩ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය මගින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර, ඒ සම්බන්ධව 2020.09.11 දින පැවැත්වෙන ත්‍රීරෝද රථ කමිටුවේදී පොලිස් ස්ථානාධිපතිතුමා සමග සාකච්ජා කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් තීරණය කරන ලදී.

**03.07 අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල ප්‍රදේශයේ කාණුවක් සම්බන්ධව තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල ප්‍රදේශයේ අරුණ ජසෙන්තුලියන මහතාගේ නිවස අසල ඇති කාණුවක් සම්බන්ධව තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර, එම කාණුව නගර සභාව මගින් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

- **පෙරවරු 10.15 ට පමණ ටෙන්ඩර් හා මිළ ගණන් විවෘත කරන ලදී.**

**03.08 අම්බලන්ගොඩ නගර සභාවට අයත් බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර මාසික කුලිය තක්සේරු කිරීම යන මැයෙන් ගාල්ල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඒවා ඇති තක්සේරුව අනුව බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල මාසික කුලිය අයකිරීම සුදුසු බවටත් කුලිය අඩුකර ඒවා ඇති කඩකාමර සම්බන්ධව තක්සේරුව වැරදි බව දන්වා ලිපියක් යැවීම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**03.09 කර්මාන්ත අංශයේ වැඩ කටයුතු ක්‍රමවත් කිරීම සඳහා අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ පදිංචි ඒ.පී.එම්.පී.වී.ගුණවර්ධන මහතා මාස 06 ක පුහුණු කාලයක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ජීව දත්ත තොරතුරු පත්‍රය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පවතින තාක්ෂණ සේවා නිලධාරී පුරප්පාඩු හේතුවෙන් කර්මාන්ත අංශයේ දෛනික රාජකාරි ඉටුකිරීමේදී ඇතිවන ප්‍රමාදයන් අවම කරගැනීම සඳහා අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ පදිංචි ඒ.පී.එම්.පී.වී.ගුණවර්ධන මහතා මාස 06 ක පුහුණු කාලයක්

සඳහා දිනකට රු.500/- ක දීමනාවක් යටතේ බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.10 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ) වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධව සැලසුම් කමිටුවේ ගත් තීරණය සභාගත කරන ලදී.**

**තීරණය -**

2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ) වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් එවා ඇති 2020.08.17 දිනැති L&M/LA/2019/692 අංක දරණ ලිපියට එකඟතාවය පලකිරීම සුදුසු බවට ගරු සභාවේ තීරණය විය.

**03.11 අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජික සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහන - දකුණු පළාත් මෙහෙයුම් කමිටුව-01 යන මැයෙන් ගාල්ල පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජික සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහන - දකුණු පළාත් මෙහෙයුම් කමිටුව-01 යන මැයෙන් ගාල්ල පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.12 රට තුළ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් නගර සභා ආපන ශාලාවේ ව්‍යාපාරික කටයුතු අඩු වූ බැවින් මාසික කුලිය සඳහා සහනයක් ලබාදෙන ලෙසත්, 2020 වර්ෂය සඳහා ආපන ශාලාව ලබාදෙන ලෙසත් ඉල්ලා එහි බදුකරු වන ඒ.එම්.ටී.ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

රට තුළ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් නගර සභා ආපන ශාලාවේ ව්‍යාපාරික කටයුතු අඩු වූ බැවින් මාසික කුලිය සඳහා සහනයක් ලබාදෙන ලෙසත්, 2020 වර්ෂය සඳහා ආපන ශාලාව ලබාදෙන ලෙසත් ඉල්ලා එහි බදුකරු වන ඒ.එම්.ටී.ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර, 2020.07.07 දින පැවති මාසික සභාවේ තීරණ අංක 3.20 අනුව සහනයක් ලබාදිය නොහැකි බවට තීරණය වූ අතර මෙම ඉල්ලීම නැවත මාස 06 කින් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**03.13 අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ විදුලිය විසන්ධි වූ අවස්ථාවලදී ආදාහනාගාරවල කටයුතු සිදුකිරීමේදී ඇතිවන අපහසුතා පිළිබඳව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ විදුලිය විසන්ධි වූ අවස්ථාවලදී ආදාහනාගාරවල ආදාහන කටයුතු සිදුකිරීමේදී ඇතිවන අපහසුතා පිළිබඳව ඉදිරිපත් කර ඇති ලිපිය අනුව, ආදාහනාගාර සඳහා සූර්ය පැනල සවිකිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.14 අම්බලන්ගොඩ කරිත්තකන්ද ප්‍රජා මණ්ඩල සාමාජිකයින් අතර බඳුන්ගත එළවලු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්ලාස්ටික් බඳුන් 150 ක් මිලට ගැනීමට ප්‍රජා මණ්ඩල ගිණුමෙන් රු.15000/- ක මුදලක් නිදහස් කරගැනීමේ ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ කරිත්තකන්ද ප්‍රජා මණ්ඩල සාමාජිකයින් අතර බඳුන්ගත එළවලු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්ලාස්ටික් බඳුන් 150 ක් මිලට ගැනීමට ප්‍රජා මණ්ඩල ගිණුමෙන් රු.15000/- ක මුදලක් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවත් එම කටයුත්ත ප්‍රජා සංවර්ධන නිලධාරිණියගේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.15 අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වනු ලබන මලල ක්‍රීඩා උළෙල සඳහා කැනපි ටෙන්ට්,ප්ලාස්ටික් පුටු සහ ඔසවන කොඩි කණු ලබාදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වනු ලබන මලල ක්‍රීඩා උළෙල සඳහා 10X10 කැනපි ටෙන්ට් 04 ක්, ප්ලාස්ටික් පුටු 50 ක් සහ සහ ඔසවන කොඩි කණු (මුද්ද සහිතව) 01 ක් සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

04. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** නැත

05. **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01 කාර්යාලයේ පරිගණක ජාල ගතකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාර්යාලයේ පරිගණක ජාල ගතකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කාර්යාලයේ පරිගණක ජාල ගතකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.02 කාර්යාලයේ සූර්ය පැනල සවිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාර්යාලයේ සූර්ය පැනල සවිකිරීම සුදුසු බවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කාර්යාලයේ සූර්ය පැනල සවිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.03 කාර්යාලයේ පොළොව කාපට් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාර්යාලයේ පොළොව කාපට් කිරීම සවිකිරීම සුදුසු බවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කාර්යාලයේ පොළොව කාපට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.04 කාර්යාලයේ වායු සමීකරණය කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාර්යාලයේ වායු සමීකරණය කිරීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කාර්යාලයේ වායු සමීකරණය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.05 කාර්යාලයේ නිලධාරීන් ස්ථානගත කිරීම සැලසුම් කිරීම සඳහා සුදුසු ස්ථානයකට භාරදීම සුදුසු බවට කරන ලද යෝජනාය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාර්යාලයේ නිලධාරීන් ස්ථානගත කිරීම සැලසුම් කිරීම සඳහා සුදුසු ආයතනයකට භාරදීම සුදුසු සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කාර්යාලයේ නිලධාරීන් ස්ථානගත කිරීම සැලසුම් කිරීම සඳහා සුදුසු ආයතනයකට භාරදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06 2020 නගර සභා පෙර පාසැල් වාර්ෂික විවිධ ප්‍රසංගය පැවැත්වීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 නගර සභා පෙර පාසැල් වාර්ෂික විවිධ ප්‍රසංගය පැවැත්වීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020 නගර සභා පෙර පාසැල් වාර්ෂික විවිධ ප්‍රසංගය පැවැත්වීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07 අම්බලන්ගොඩ නගර සභා ගෙවතු වගා වැඩසටහන 2020 (දෙවන අදියර) පැවැත්වීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා ගෙවතු වගා වැඩසටහන 2020 (දෙවන අදියර) පැවැත්වීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා ගෙවතු වගා වැඩසටහන 2020 (දෙවන අදියර) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ප්‍රවර්ධන සඳහා අත් පත්‍රිකා 1000 ක් මුද්‍රණය කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ප්‍රවර්ධන සඳහා අත් පත්‍රිකා 1000 ක් මුද්‍රණය කිරීම සුදුසු යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ප්‍රවර්ධන සඳහා අත් පත්‍රිකා 1000 ක් මුද්‍රණය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09 නගර සභා පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත පොත් ලබාදීම සුදුසු බවට යෝජනා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නගර සභා පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත පොත් ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

නගර සභා පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත පොත් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10 පෙර පාසැල් ළමුන් බඳවා ගැනීම වෙනුවෙන් බැනර් මුද්‍රණය කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පෙර පාසැල් ළමුන් බඳවා ගැනීම වෙනුවෙන් බැනර් මුද්‍රණය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

පෙර පාසැල් ළමුන් බඳවා ගැනීම වෙනුවෙන් බැනර් මුද්‍රණය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.11 ආයුර්වේද මධ්‍යස්ථානය හා කාය වර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ආයුර්වේද මධ්‍යස්ථානය හා කාය වර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

ආයුර්වේද මධ්‍යස්ථානය හා කාය වර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.12 පින්නදූව රවුම් පාර පැති බැම්ම (සෝමරත්න මහතාගේ නිවස අසල) ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පින්නදූව රවුම් පාර පැති බැම්ම (සෝමරත්න මහතාගේ නිවස අසල) ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

පින්නදූව රවුම් පාර පැති බැම්ම (සෝමරත්න මහතාගේ නිවස අසල) ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13 පින්නදූව රවුම් පාර කාණුව හා පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

පින්නදූව රවුම් පාර කාණුව හා පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්__

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

පින්නදූව රවුම් පාර කාණුව හා පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14 පී.එච්.ආර්.සුමනදාස මාවත කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

පී.එච්.ආර්.සුමනදාස මාවත කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්__

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ,කළුවඩුමුල්ල,පී.එච්.ආර්.සුමනදාස මාවත , සමන්ත මහතාගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද

යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.15 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ වහල අලුත්වැඩියා කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ වහල අලුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ වහල අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.16 ඕකන්ද පුස්තකාලය හා පෙර පාසල් ගොඩනැගිල්ලේ තින්ත ආලේප කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඕකන්ද පුස්තකාලය හා පෙර පාසල් ගොඩනැගිල්ලේ තින්ත ආලේප කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

ඕකන්ද පුස්තකාලය හා පෙර පාසල් ගොඩනැගිල්ලේ තින්ත ආලේප කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.17 මහ අම්බලන්ගොඩ පාර ජල නල එලීමේ කර්මාන්තයේ ABC අතුරා තැලීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ පාර ජල නල එලීමේ කර්මාන්තයේ ABC අතුරා තැලීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මහ අම්බලන්ගොඩ පාර ජල නල එලීමේ කර්මාන්තයේ ABC අතුරා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.02 ගරු නගර සභා මන්ත්‍රී ඊඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01 පොල්වත්ත ආදාහනාගාර භූමියේ අබලන් වී ඇති අනවශ්‍ය ගොඩනැගිලි කඩා ඉවත්කර ආදාහනාගාරයට එනු ලබන වාහන නවත්වා තැබීම සඳහා ස්ථානයක් සකස් කර එහි ගෙවත්ත මල් වවා අලංකාර කිරීම සුදුසු බවට යෝජනා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

පොල්වත්ත ආදාහනාගාර භූමියේ අබලන් වී ඇති අනවශ්‍ය ගොඩනැගිලි කඩා ඉවත්කර ආදාහනාගාරයට එනු ලබන වාහන නවත්වා තැබීම සඳහා ස්ථානයක් සකස් කර එහි ගෙවත්ත මල් වවා අලංකාර කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

පොල්වත්ත ආදාහනාගාර භූමියේ අබලන් වී ඇති අනවශ්‍ය ගොඩනැගිලි කඩා ඉවත්කර ආදාහනාගාරයට එනු ලබන වාහන නවත්වා තැබීම සඳහා ස්ථානයක් සකස් කර එහි ගෙවත්ත මල් වවා අලංකාර කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.03. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.03.01 අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ කෙරමිණිය, පින්නදූව, පොල්වත්ත හා තල්ගස්ගොඩ යන කොට්ඨාස තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස මී මැසි ජනපද 20 ක් පිහිටුවීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ කෙරමිණිය, පින්නදූව, පොල්වත්ත හා තල්ගස්ගොඩ යන කොට්ඨාස තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස මී මැසි ජනපද 20 ක් පිහිටුවීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ කෙරමිණිය, පින්නදූව, පොල්වත්ත හා තල්ගස්ගොඩ යන කොට්ඨාස තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස මී මැසි ජනපද 20 ක් පිහිටුවීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

- ගරු සභාපතිතුමා ගරු සභා ගර්භයෙන් නික්ම ගියහ.
- ගරු සභාවේ මුලාසනයට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පැමිණියහ.

**05.04 ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් කරන ලද යෝජනාව**

05.04.01 අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටින නිවැසියන්ගේ දරුවන් නගරයේ ඇති පාසල්වල පළමු ශ්‍රේණියට (01 වසරට) ඇතුළත් කිරීමේදී නීත්‍යානුකූල ඔප්පු නොමැතිවීම මහත් ගැටලුවක් වී ඇති බවත් ඒ සඳහා ඔප්පු සම්බන්ධයෙන් ලකුණු ලබාදීමේදී ඔවුන්ට සාධාරණයක් වන ලෙස ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. ආර්.පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටින නිවැසියන්ගේ දරුවන් නගරයේ ඇති පාසල්වල පළමු ශ්‍රේණියට (01 වසරට) ඇතුළත් කිරීමේදී නීත්‍යානුකූල ඔප්පු නොමැතිවීම මහත් ගැටලුවක් වී ඇති බවත් ඒ සඳහා ඔප්පු සම්බන්ධයෙන් ලකුණු ලබාදීමේදී ඔවුන්ට සාධාරණයක් වන ලෙස ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර , මෙම කාරණය සම්බන්ධව සාකච්ජා කිරීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා හමුවට යාම සුදුසු බවටත් පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරී හෝ කොට්ඨාස මන්ත්‍රීවරයා තහවුරු කරන්නේ නම් පදිංචි ස්ථානයට වරිපනම් ගෙවන බවට නගර සභාවෙන් ලිපියක් නිකුත් කරන ලෙස මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් දන්වන ලදී.

- ගරු සභාපතිතුමා නැවත සභාවේ මූලාසනයට පැමිණෙන ලදී.

## 06. කාරක සභා වාර්තා

**06.01 2020.08.20 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.08.20 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

එම යෝජනා කරනවා.

**තීරණය**

2020.08 .20 දින පැවති මුල්‍ය කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**06.02 2020.08.17 දින පැවති පුස්තකාල කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2020.08.17 දින පැවති පුස්තකාල කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

එම යෝජනා කරනවා.

**තීරණය**

2020.08.17 දින පැවති පුස්තකාල කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2020.08.25 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2020.08.25 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.07.21 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2020.08.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.08.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.08.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2020.08.25 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.08.25 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**තීරණය**

2020.08.25 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.06 2020.08.27 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.08.27 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.08.27 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 07. ටෙන්ඩර් හා මිල ගණන්

**07.01 ටෙන්ඩර්**

**07.02 මිල ගණන්**

**07.02.01 දරු ප්‍රසූතියේදි ගර්භණී මවුවරුන් සඳහා අවශ්‍ය වන භාණ්ඩ සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සිහිනි සළු අම්බලන්ගොඩ | ඩිලාන් පැෂන් අම්බලන්ගොඩ | සිහිනි ගෙදර මාතර |
|---|---|---|---|---|---|
| 01 | චිත්ත | 225 | රු.265/= | රු.325/= | රු.280/= |
| 02 | සුදු චීත්ත | 75 | රු.265/= | රු.325/= | රු.280/= |
| 03 | බෙඩ් ජැකට් ( L ) | 225 | රු.195/= | රු.195/= | රු.200/= |
| 04 | සුදු බෙඩ් ජැකට් ( L ) | 75 | රු.195/= | රු.195/= | රු.200/= |
| 05 | ඇඳ ඇතිරිලි | 75 | රු.455/= | රු.325/= | රු.420/= |
| 06 | සුදු ඇඳ ඇතිරිලි | 75 | රු.395/= | රු.395/= | රු.340/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | සුදු කොට්ට උර | 75 | රු.135/= | රු.125/= | රු.150/= |
| 08 | සනීපාරක්ෂක තුවා පැකට් | 150 | රු.109/= | රු.120/= | රු.105/= |
| 09 | වස්ති බෝතල් | 75 | රු.385/= | රු.391/= | රු.290/= |
| 10 | උෂ්ණත්වමාන | 75 | රු275/= | - | රු.270/= |
| 11 | පැනල් 36×36 | 75 | රු218/= | රු235/= | රු260/= |
| 12 | නැප්කින් 22×22 | 75( පැකට්) | රු270/= | රු295/= | රු290/= |

**තීරණය:-**

දරු ප්‍රසූතියේදී ගර්භණී මව්වරුන් සඳහා අවශ්‍ය වන භාණ්ඩ ලබාගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ සිහිති සළු ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ | ප්‍රමාණය | වර්ගය | Mazda Hardwae & Power Tools Colombo | CD Suppliers Colombo | National Hardware Colombo |
|---|---|---|---|---|---|---|
| 01 | 1 ½ විෂ්කම්භය සහිත 2.3mm(15 ½ Kg ) ඝනකම ඇති Heavy Dyty G.I. බට | 60 | සංස්ථා වානේ | රු.4200/- | රු.4650/- | රු.2540/- |
| | Clip | 60 | | රු.195/- | රු.200/- | රු.160/- |

**07.02.02** **පලංචි වලට අවශ්‍ය GI පයිප්ප මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති**

**තීරණය:-**

පලංචිවලට අවශ්‍ය G.I. පයිප්ප ලබාගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති National Hardware ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.03 Hilti Machine එකක් කුලියට ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ | ප්‍රමාණය | BKSකන්ස්ට්‍රක්ෂන් අම්බලන්ගොඩ | ලක්මාල් එන්ටර්ප්‍රයිසස් | හිරු ඉංජිනියර්ස් අම්බලන්ගොඩ |
|---|---|---|---|---|---|
| 01 | **Hilti Machine** එකක් තුල දිනකට කුළිය | දින 7 | රු.3000-<br><br>3000×3 =රු.21000/- | රු.2500/-<br><br>2500×3 =රු.17500/- | රු.2500/-<br><br>2500×3 =රු.17500/- |

**තීරණය:-**

Hilti Machine එකක් කුලියට ලබාගැනීම සඳහා සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණද ගරු සභාව තීරණය කළේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතාගේ උපදෙස් අනුව අලුතින් Hilti Machine එකක් සුදුසු ආයතනයකින් මිලදී ගන්නා ලෙස ගරු සභාව තීරණය කරන ලදී.

**08** ගෙවීම්

08:01 2020 ජුනි මාසයට සභාව සතු සියලුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් රු.259498.50/- ක් සී/ස. අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති

එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:02 ඇණවුම් අංක 2482 යටතේ ඇණවුම් කරන ලද කාර්යාල පුටු 05 ක් සහ වානේ අල්මාරි 01 ක් ලබාගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, කෙරමිණිය, සුසන්ත ඩිස්ට්‍රිබියුටර්ස් වෙත රු.46220/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:03 ඇණවුම් අංක 2492,2493,2495 යටතේ මාර්ග අලුත්වැඩියාවට ඇණවුම් කරන ලද ABC ගල් කියුබ් 32 ක් ලබාගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර, පී.එච්.සී.සී ද සිල්වා මහතා වෙත රු.220800/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:04 ඇණවුම් අංක 2491 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් වෙනුවෙන් රු.48280/- ක් අම්බලන්ගොඩ, ඇල්පිටිය පාර, එස්.එච්.එන්.අරුණ ශාන්ත ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:05 ඇණවුම් අංක 2402 යටතේ ට්‍රැක්ටර් රථ සඳහා ගබඩාවට ඇණවුම් කරන ලද ටයර්, ටියුබ් වෙනුවෙන් රු.92340/- ක් සී/ස.ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:06 ඇණවුම් අංක 2432 යටතේ ඇණවුම් කරන ලද MP 90 වර්ගයේ ගියර් ඔයිල් ලීටර් 25 ක් ලබාගැනීම වෙනුවෙන් රු.15540/- ක් සී/ස.අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:07 2020 වර්ෂයට නගර සභා පෙර පාසල් දරුවන් 139 දෙනෙකු සඳහා ඇඳුම් මැසීම වෙනුවෙන් රු.30580/- ක් අම්බලන්ගොඩ, නව පාර, ස්පයිඩර් ගාර්මන්ට් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:08 අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ 2020.05.19 දින සිට 2020.07.17 දින දක්වා සහ වෙරළ උද්‍යානයේ 2020.05.18 දින සිට 2020.07.16 දින දක්වා විදුලි බල්පත් වෙනුවෙන් රු.10128.30 ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:09 නගර සභා ප්‍රධාන පුස්තකාලයේ 2020.05.20 දින සිට 2020.07.18 දින දක්වාත්, පෝරඹ පුස්තකාලයේ 2020.05.05 දින සිට 2020.06.03 දින දක්වාත්, පොල්වත්ත පෙර පාසලේ 2020.06.05 දින සිට 2020.07.05 දින දක්වාත් විදුලි බල්පත් වෙනුවෙන් රු.11157.89 ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:10 නගර සභා කාර්යාලයේ 2020.05.20 දින සිට 2020.07.18 දින දක්වා සහ නගර සභා ගබඩාවේ 2020.05.20 දින සිට 2020.07.18 දින දක්වා විදුලි බල්පත් වෙනුවෙන් රු.19517.80 ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:11 2020.05.04 දින සිට 2020.07.01 දින දක්වා අම්බලන්ගොඩ බස් නැවතුම්පොලෙහි වීදි ලාම්පු වෙනුවෙන් සහ පොලිස් මුරපොළලෙහි විදුලි බිල්පත් වෙනුවෙන් රු.17914.70 ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:12 2020.05.20 දින සිට 2020.07.18 දින දක්වා අම්බලන්ගොඩ පොදු මංමාවත්වල විදුලි බිල්පත් වෙනුවෙන් රු.24616/- ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08.13 2020.05.20 දින සිට 2020.07.18 දින දක්වා අම්බලන්ගොඩ නගර සභා ශාලාවේ විදුලි බිල්පත් වෙනුවෙන් රු.24467.50 ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා

විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

8:14 අම්බලන්ගොඩ පොල්වත්ත රංග පීඨය, පොල්වත්ත ආදාහනාගාරය, හීගල්දූව පාර පටබැඳිමුල්ල ආදාහනාගාරය යන ස්ථානවල විදුලි බිල්පත් වෙනුවෙන් රු.12552.85 ක් සී/ස.ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:15 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 අගෝස්තු මස ගමන් වියදම් ලෙස රු.153,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:16 හල්වතුර කසල අංගනයට පස් කියුබ් 100 ක් ලබාගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර, පී.එච්.සී.සී.ද සිල්වා මහතා හට රු.290000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:17 මහජන ක්‍රීඩාංගනයේ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය පැත්තේ පැති බැම්ම හා සපත්තු කාණුව ඉදිකිරීමේ කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ලෙස රු.20305.47 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:18 අම්බලන්ගොඩ, එල්.සී.ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරීමේ (අදියර 02) කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ලෙස රු.15682.71 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:19 අම්බලන්ගොඩ, එල්.සී.ද සිල්වා මාවතේ කාණුව සකස් කිරීම - අදියර 01(සේනක මහතාගේ නිවසේ සිට උමායා හෝටලය ගේට්ටුව දක්වා) කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ලෙස රු.34018.57 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

08:20 2020 අප්‍රේල් මස 01 ,02 යන දිනයන්හි ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් රු.12000/- ක මුදලක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:21 නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට ඖෂධ ලබාගැනීම වෙනුවෙන් රු.300000/- ක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:22 2020.07.27 දින සිට 2020.08.27 දින දක්වා නගර සභා කාර්යාලයේ ජල බිල්පත් වෙනුවෙන් රු.10420.56 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:23 හදිසි ආපදා හේතුවෙන් හානියට පත් දේපල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.100000/- ක අත්තිකාරම් මුදලක් ප්‍රජා සංවර්ධන නිලධාරී ඕ.ජේ.එල්.විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**09** ගිණුම්

09.01 2020 ජුලි මසට අදාළ පොදු වියදම් වාර්තාව , වැය විශ්ලේෂණය හා ලැබීම් විග්‍රහය සභාගත කරන ලදී.

**තීරණය**

2020 ජුලි මසට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

ඇස්තමේන්තු

**10**

**10.01 2020 වර්ෂයේ නගර සභා පෙර පාසැල් වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා රු.4,70,939/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

2020 වර්ෂයේ නගර සභා පෙර පාසැල් වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා රු.4,70,939/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.02 අම්බලන්ගොඩ නගර සභා ගෙවතු වගා වැඩසටහන 2020 (දෙවන අදියර) පැවැත්වීම සඳහා රු.2,45,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ගෙවතු වගා වැඩසටහන 2020 (දෙවන අදියර) පැවැත්වීම සඳහා රු.2,45,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.03 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ප්‍රවර්ධන සඳහා අත් පත්‍රිකා 1000 ක් මුද්‍රණය කිරීමට රු.6000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ප්‍රවර්ධන සඳහා අත් පත්‍රිකා 1000 ක් මුද්‍රණය කිරීමට රු.6000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.04 නගර සභා පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත පොත් ලබාදීම වෙනුවෙන් රු.15000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

නගර සභා පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත පොත් ලබාදීම වෙනුවෙන් රු.15000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.05 පෙර පාසැල් ළමුන් බඳවා ගැනීම වෙනුවෙන් බැනර් මුද්‍රණය කිරීම සඳහා රු.12000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පෙර පාසැල් ළමුන් බඳවා ගැනීම වෙනුවෙන් බැනර් මුද්‍රණය කිරීම සඳහා රු.12000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.06 පින්නදූව රවුම් පාර පැති බැම්ම (සෝමරත්න මහතාගේ නිවස අසල) ඉදිකිරීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පින්නදූව රවුම් පාර පැති බැම්ම (සෝමරත්න මහතාගේ නිවස අසල) ඉදිකිරීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.07 පින්නදූව රවුම් පාර කාණුව හා පාර කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1500,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පින්නදූව රවුම් පාර කාණුව හා පාර කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1500,000/- ක ඇස්තමේන්තුව (යෝජනා අංක 10) පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.08 අම්බලන්ගොඩ,කළුවඩුමුල්ල,පී.එච්.ආර්.සුමනදාස මාවත,සමන්ත මහතාගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.720,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ,කළුවඩුමුල්ල,පී.එච්.ආර්.සුමනදාස මාවත,සමන්ත මහතාගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.720,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.09 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ වහල අලුත්වැඩියා කිරීම (අදියර 02) සඳහා රු.1000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ වහල අලුත්වැඩියා කිරීම (අදියර 02) සඳහා රු.1000,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.10 ඕකන්ද පුස්තකාලය හා පෙර පාසල් ගොඩනැගිල්ලේ තින්ත ආලේප කිරීම සඳහා රු.230000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

ඕකන්ද පුස්තකාලය හා පෙර පාසල් ගොඩනැගිල්ලේ තින්ත ආලේප කිරීම සඳහා රු.230000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.11 මහ අම්බලන්ගොඩ පාර ජල නල එලීමේ කර්මාන්තයේ ABC අතුරා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

මහ අම්බලන්ගොඩ පාර ජල නල එලීමේ කර්මාන්තයේ ABC අතුරා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1000,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු

බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.12 ආයුර්වේද මධ්‍යස්ථානය හා කාය වර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා රු.3,200,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

ආයුර්වේද මධ්‍යස්ථානය හා කාය වර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා රු.3,200,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ජ්.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**11** වෙනත් කරුණු

12 න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ කරුණු

**12.01 ගා/පී.ද.එස්.කුලරත්න මහා විද්‍යාංලයේ 2020.08.23 දින පැවැත්වූ ශ්‍රමදානය සඳහා උපකරණ සැපයීම වෙනුවෙන් ස්තූතිය පුදකර එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ , ගා/පී.ද.එස්.කුලරත්න මහා විද්‍යාලයේ 2020.08.23 දින පැවැත්වූ ශ්‍රමදානයට උපකරණ සැපයීම වෙනුවෙන් ස්තූතිය පුදකර විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**12.02 ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය අනුව දැනට ජල මාර්ග හරහා පාලම් ඉදි නොවූ,

1.තල්ගස්ගොඩ පාර හා නිව්යෝර්ක් ගම්මානය යාවෙන මාර්ගයේ ඉදි කළ යුතු පාලම

2.හල්වතුර යෝජනා ක්‍රමය එක්කරන මාර්ගයේ පාලම

3. හල්වතුර පෝරඹ යා වන පාලම

යන පාලම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවටත් පොල්වත්ත-බටපොල මාර්ගයේ පොඩි පාලම සහ රොසෙත් රෝහල අසළ ඇති මහ පාලමට සමාන්තරව පදිකයින්ට යාම සඳහා අඩි 03 ක් පමණ හෝ පළලට පාලමක් ඉදිකිරීම යන යෝජනා 02 ද ඇතුළත් කිරීම සුදුසු බවට තීරණය විය.

**12.03 අම්බලන්ගොඩ, ඕකන්ද ප්‍රජා ශාලා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට ඕකන්ද ප්‍රජා මණ්ඩලය මගින් මූල්‍ය දායකත්වය ලබාගැනීම සඳහා අනුමැතිය ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ, ඕකන්ද ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු නගර සභාව මගින් සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.04 අධික සුළඟ හා වර්ෂාව හේතුවෙන් බස් නැවතුම්පොළ වහලට, පටබැඳිමුල්ල ආදාහනාගාරයේ වහලට හා පොදු වෙළඳසැළෙහි වහලට හානි සිදුවීම හේතුවෙන් මිල ගණන් කැඳවීමකින් තොරව අවශ්‍ය භාණ්ඩ ලබාගැනීමට රු.40000/- ක අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා සැපයුම් නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.**

**තීරණය -**

අධික සුළඟ හා වර්ෂාව හේතුවෙන් බස් නැවතුම්පොළ වහලට, පටබැඳිමුල්ල ආදාහනාගාරයේ වහලට හා පොදු වෙළඳසැළෙහි වහලට හානි සිදුවීම හේතුවෙන් මිල ගණන් කැඳවීමකින් තොරව අවශ්‍ය භාණ්ඩ ලබාගැනීමට රු.40000/- ක අත්තිකාරම් මුදලක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.05 අම්බලන්ගොඩ, පෝරඹ ළිඳමුල්ලවත්ත පාරේ ඇති විදුලි කණුවක් පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා රු.21725/- ක මුදලක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ගෙවිය යුතු බව දන්වා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ, පෝරඹ, ළිඳමුල්ලවත්ත මාර්ගයේ ඇති විදුලි කණුවක් පිහිටි ස්ථානය, සේවා රැහැන් වෙනස් කිරීම සඳහා රු.21725/- ක ඇස්තමේන්තුගත මුදලක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ගෙවිය යුතු බව දන්වා එවා ඇති ලිපිය අනුව එම මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ඒකමතිකව ලදුව සභා සම්මත විය.

**12.06 තෝමස් ද සිල්වා මාවත පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

**තෝමස් ද සිල්වා මාවත පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම** යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා ඇති ලිපිය අනුව ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධව පෙර තිබූ ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට අවස්ථාව සලස්වා දෙන ලෙසට ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.07 අම්බලන්ගොඩ තානායම් භූමියේ අවුරුදු 150 ක් පැරණි ගස් දෙකෙහි වටිනාකම තීරණය කිරීමට කමිටුවක් පත්කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ තානායම් භූමියේ තිබූ අවුරුදු 150 ක් පමණ පැරණි ගස් දෙකක් කපා ඉවත් කිරීම හේතුවෙන් එම ගස් දෙකෙහි වටිනාකම තීරණය කිරීමට පරිපාලන නිලධාරී, අභ්‍යන්තර විගණන

නිලධාරී, ආදායම් පරීක්ෂක ටී.චන්න මහතා සහ තාක්ෂණ සේවා නිලධාරී හර්ෂණ නීලමුණී මයාගෙන් සමන්විත නිලධාරීන් සහ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝහිත රංජිත් මහතා, ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය, ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි මහත්මිය, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා යන මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර, කමිටුවේ ගන්නා තීරණය අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා දැන්වීය.

පස්වරු 1.00 ට සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදිප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.09.16

වන දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී.